නුවනත විද්‍යුත් සිංහල සඟරාව
වෙළුම 01, 2022, 109 - 120

සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණු විශ්වවිද්‍යාලය

# මහා කාව්‍ය ලක්ෂණ පිළිබිඹු වන මුවදෙව්දාවත

## හැඳින්වීම

**පොලොන්නරුව රාජධානි සමයේ** රචනා කරන ලද මුවදෙව්දාවතෙහි **කර්තෘ අඥාත** ය. **මුවදෙව්දාවත, සසදාවත** හා **කව්සිළුමිණට** පෙර රචනා වුව ද එකී ග්‍රන්ථය ඛණ්ඩ කාව්‍ය ගණයෙහි ලා අයත් වේ. ඒ මහා කාව්‍යයක තිබිය යුතු ඇතැම් ලක්ෂණ පමණක් අන්තර්ගත වීම හේතුවෙනි. **මුවදෙව්දාවත** සඳහා පාදක කර ගත් මඛාදේව ජාතකය **ජාතකට්ඨකථාවේ අපණ්ණක වග්ගයෙහි නවවැන්නේ** සඳහන් ජාතකය වේ. **හෙළ ගී 164කින්** යුක්ත **මුවදෙව්දාවතෙහි** කතුවරයා අඥාත වුව ද සංස්කෘත හා පාලි භාෂාවන්හි විද්වතෙකු බව මෙහි එන ඇතැම් සකු ගී සිංහලයට නඟා දැක්වීමෙන් පැහැදිලි වෙයි. මෙහි වස්තු බීජය නම්, නරකෙසක් දුටු මඛාදේව රජු ගිහි ගෙය අත්හැර තපසට දිව යන විරාගී සංකල්පයක් නිරූපණය කෙරෙන කාර්යයක් ලෙස ද විචාරකයෝ හඳුන්වති. මෙහි දී මුවදෙව්දාවත මහා කාව්‍යයක් ලෙස කෙතරම් දුරට සාර්ථක ද අසාර්ථක ද යන්න පිළිබඳ සාකච්ඡා කෙරෙයි.

## මුවදෙව්දාවත අසාර්ථක කාව්‍යයක් වීමට හේතු:

1. මුවදෙව්දාවත සඳහා වස්තු විෂය කර ගත් ජාතක කතාවේ නුසුදුසු බව
2. “පෙදෙන් බුදු සිරිත” යන නීතියත් මහා කාව්‍ය සම්ප්‍රදායත් අතර ඇති වන ගැටුම
3. ප්‍රතිභාපූර්ණ බවින් තොර වීම
4. අනුචිත වර්ණනා කිරීම්
5. තම අභිමතය පරිදි වර්ණනා එක් කිරීම

## 1. මුවදෙව්දාවත සඳහා වස්තු විෂය කර ගත් ජාතක කතාවේ නුසුදුසු බව

**මුවදෙව්දාවත** සඳහා ගත් කථා වස්තුව ඉතිහාසයෙන් ගන්නා ලද වෘත්තාන්තයක් වන අතර, පාලි අටුවා ජාතක කතාවෙහි එන මඛාදේව ජාතකය පාදක කොටගෙන රචනා කරන ලද්දකි. සංස්කෘත ආලංකාරිකයන්ට අනුව **මහාභාරතය, පුරාණ** හා **රාමායණ** ග්‍රන්ථ හින්දූන්ගේ පැරණි ග්‍රන්ථ වූ අතර බෞද්ධයා මහා කාව්‍ය සඳහා ගත් කථා වස්තු වූයේ, බුදුන් වහන්සේගේ අතීත භවයන්හි පුවත් හෙළිවන ජාතක අටුවාව යි. පුරාණයේ සිට ම මෙය පැවත ගෙන ආ දෙයක් වූ අතර **සියබස්ලකර** කතුවරයා “පෙදෙන් බුදු සිරිතැ” යනුවෙන් කළ නිර්දේශයකට අනුව එතැන් පටන් මහා කාව්‍ය සම්ප්‍රදාය ඇසුරු කොට කාව්‍ය රචනා කළ කිවිහු ජාතක කථා වස්තු විෂය කොට ගත්හ.

9 772950 655005

හෙළ බසින් රචනා කරන ලද පැරණි ම කෘතියක් වන **මුවදෙව්දාවත** පිළිබඳ විද්වත්හු තම මත පළ කරති. ඒ අතර මාර්ටින් වික්‍රමසිංහ මහතා දක්වන්නේ,

“ඒ කාව්‍යයට ම වස්තු විෂය වූයේ සසර කලකිරවන පස්කම් සැපයෙහි නිසරු බව කියන බෞද්ධ කතා දෙකකි. ව්‍යාජ සංස්කෘත කාර්යයට වහල් වන සිංහල කවීන් දෙදෙනා අනුචිත ශෘංගාර වර්ණනයෙන් ඒ බෞද්ධ කථා වස්තු දෙක ම දූෂණය කළහ.” (වික්‍රමසිංහ, 2005, පි. 19). යනුවෙනි. සැබැවින් ම මඛාදේව ජාතකය යනු, කාව්‍යයක් රචනා කිරීමට උචිත තරමේ කථා වස්තුවක් නොවේ. එනම් එය සංස්කෘත කථා වස්තුවක් වේ. මේ අනුව මඛාදේව ජාතකය අන්තර්ගත ව නැතහොත් කථා වස්තුවේ සංසිද්ධි කාව්‍යකරණයේ සැහීමකට තරම් අලංකාරවත් බවකින් යුක්ත නොවේ. ශෘංගාරාත්මක අයුරින් වර්ණනා කිරීම හේතුවෙන් මෙය කාව්‍යයක් ලෙස ප්‍රබල වශයෙන් අසාර්ථක වී ඇති බැව් පෙනේ.

මාර්ටින් වික්‍රමසිංහ මහතා දක්වන්නේ,

මහා කාව්‍යයක කතා නායකයා යනු උදාර චරිතයකි. එහි දී සිදු වන්නේ ඔහුගේ ගුණාතිශය වර්ණනා කිරීම යි. **මුවදෙව්දාවත** ලෝකයා අතර ප්‍රචලිත වූ කථා වස්තුවක් වූ අතර කථා වස්තු නායක මඛාදේව රජු චතුර වුත්, උදාර වුත් ධීර වූ මහා පුරුෂයෙකු නොවන බව සඳහන් කරයි. කථා වස්තු නායකයාගේ ගුණ උත්කර්ෂවත් ව වර්ණනා කිරීම මෙහි දී සිදු නොවේ. තියුණු තෙද සතුරන් මැඩීම, රූපශ්‍රීයෙන් යුතු බව, කීර්තිමත් බව ආදි කිසිවකුදු විස්තර නො කෙරෙයි. තපසට ගිය මඛාදේව රජුගේ තතු මෙහි දී කවියා විස්තර කරනුයේ **මුවදෙව්දාවත** මහා කාව්‍ය ලක්ෂණ පිළිබිඹු නොකරන්නක් බව අඟවන්නාක් මෙන් ය.

**කව්සිළුමිණ** සඳහා විචාරයක් ඉදිරිපත් කරන සුචරිත ගම්ලත් මහතා පවසන්නේ,

“මහා කාව්‍යයට අවශ්‍ය වර්ණනා හා බද්ධ කර ගිහි ජීවිතය ඇලුම් කළ නායකයකු වටා ගෙතුණු කථා පුවතක් මෙහි නොමැති බව යි. මෙහි සිටින්නේ ගිහි ජීවිතය හැර තපසට ගිය කෙනකුගේ කථා වස්තුවකි. එසේ ගිය බෝසතුන්ගේ කතා පුවත මහා කාව්‍ය අනුචිත වර්ණනා බලයන් ඇතුළු කළ කල්හි ඒවා චරිත නිරූපණය සමඟ අභේද්‍යය ලෙස නොබැඳේ. මේ හෙයින් මඛාදේව ජාතකය මහා කාව්‍යයට ප්‍රවිශ්ට විය හැකි සදාචාරය කිව නොහැකි ය.” (ගම්ලත්, 2004, පි. 194). යනුවෙනි.

මඛාදේව ජාතකය කාව්‍යයට නැඟූ **මුවදෙව්දාවත** කතුවරයාට යුද වර්ණනාවට අවස්ථාවක් හිමි නොවේ. මඛාදේව රජු තවුස්දම් පුරමින් ජීවත් වන අයෙකු මිස ලෞකික සැප විඳිමින් රාජ්‍ය කරන රජ කෙනෙකු නොවේ. **මුවදෙව්දාවත** කතුවරයා කාව්‍ය සඳහා යොදා ගත් ජාතක කථාවෙන් ඇතැම් ලක්ෂණ මතු කර දැක්වීම අපහසු බැව් මෙයින් ප්‍රතීතවත් වේ.

## 2. පෙදෙන් බුදු සිරිත යන නීතියත් මහා කාව්‍ය සම්ප්‍රදායත් අතර ඇති වන ගැටුම

මහා කාව්‍ය ආශීර්වාදයකින්, නමස්කාරයකින් හෝ වස්තු නිර්දේශයකින් ආරම්භ වේ යන මහා කාව්‍ය ලක්ෂණයන්ගෙන් **මුවදෙව්දාවත** ආරම්භ කළ ද එය සාර්ථක නොවේ. ගෞතම බුදුන්

9 772950 655005

වහන්සේගේ ගුණ වර්ණනාවට පාත්‍ර කරමින් බුද්ධ වන්දනය පෙරටු කර ගනිමින් කතුවරයා තම කාව්‍යය වූ **මුවදෙව්දාවත** ආරම්භ කරයි. මේ අනුව **මුවදෙව්දාවත** අසාර්ථක කාව්‍යයක් වීමට බලපෑ ප්‍රධාන ම කරුණ "පෙදෙන් බුදු සිරිතැ" යන නීතියත් පහත සඳහන් මහා කාව්‍ය ලක්ෂණ වන,

1. සර්ගවලට බෙදා නොමැති වීම
2. උදාර නායකයෙක් නොමැති වීම
3. මහා කාව්‍යයන්හි අන්තර්ගත විය යුතු ඇතැම් වර්ණනා ඉදිරිපත් නොවීම
4. **කාව්‍යාදර්ශයට** අනුව වර්ණනා කළ යුතු කාරණය ඒ අයුරින් වර්ණනා කර නොමැති වීම (උයන් කෙළි වැනුම)
5. විවාහය, කුමාරෝත්පත්තිය, දූත ගමන්, යුද්ධය ආදි රාජ විස්තර ඇතුළත් නොවීම
6. කාව්‍යාලංකාර යොදා ගැනීමේ දී ඉතා සුළු අලංකාර පමණක් භාවිත කර තිබීම (උපමා, රූපක)
7. රසිකයා තෘප්තියට පත් කළ යුතු වූ තන්හි තෘප්තියට පත් කිරීමට සමත් නොවීම
8. පැරණි කථා වස්තුවක් යොදා ගත්ත ද රසිකයාට රසයක් දැනෙන අයුරින් එය වර්ණනා කර නොමැති වීම
9. රජුගේ ධීර වීර වික්‍රමාතිශය, උගත්කම යනාදිය වර්ණනා නොකිරීම

ආදි මෙම ලක්ෂණ අතර ඇති වන සට්ටනය බව පැහැදිලි ව දැක්විය හැකි ය. ඒ අනුව මෙම **මුවදෙව්දාවත** කාව්‍යයක් නොවන බව සසාධක ව ඔප්පු කළ හැකි වේ. නිදසුනක් ලෙස මහා කාව්‍යයේ එන පළමු ලක්ෂණයෙන් ඒ බව තවදුරටත් පැහැදිලි කර ගත හැකි ය.

**එළුසඳැස්ලකුණෙහි** එන ගජගැම් විරිත අනුව යමින් රචිත එහි මුල් කවිය පහත පරිදි වේ.

"නුවණිනි		සයුරා
විනේ කුමුදු		නිසයුරා
කෙලෙස් තුසර		දිවයුරා
බව දුක් ලැව්		අගයුරා

සත් තිසර		සරා
ගුණ බිඟු පෙළ		මහසරා
විසා දලනිඳු		පසාරා
තිත් ගජ තනට		කෙසරා

රා වස මතු		රා
සග මොක් සුවට		යතුරා
උවඩුරු අඳුරු		මිතුරා
නමව් තිලොවෙක		මිතුරා" (වනරත්න, 2002, පි. xiii).

නුවණ නමැති ගංගාවන්ට සමුද්‍රය වන්නා වූ ද, හික්ම විය යුතු ජන නමැති කුමුදු පුබුදුවන සඳ වැනි වූ ද, රාගා දි කෙලෙස් පිනි නැසීමට හිරු වැනි වූ ද, සසර දුක් නමැති වනය දැවීමට ගින්නක් වූ ද, සත් පුරුෂ

නමැති හංසයන්ට විලක් බඳු වූ ද, ශීලාදි ගුණ නමැති භෘංගයන්ට මහා නෙළුමක් වූ ද, පස්කම් සැප තරණය කිරීමට නෞකාවක් බඳු වූ ද, මිත්‍යා දෘෂ්ටිය නම් හස්තීන් මැඩීමට සිංහරාජයෙකු බඳු වූ ද, තණ්හාව නමැති විෂ නැසීමට මහා ඖෂධයක් වූ ද, ස්වර්ග මෝක්ෂ සැපයට පැමිණීමට මාර්ගයක් වූ ද, උවදුරු නමැති අන්ධකාරය නිවීමට පහනක් බඳු වූ ද, කාම ලෝක රූප ලෝක හා අරූප ලෝක යන තුන් ලොවට එක ම අසහාය මිත්‍ර වූ සර්වඥයන් වහන්සේ වන්දනා කරමි. (වනරත්න, 2002, පි. xiv). යනු මෙම ආරම්භක පද්‍යයේ අර්ථය යි.

කවියා මෙහි දී බුදුරජාණන් වහන්සේගේ අපරිමිත වූ ගුණ සමුදාය අපූර්වත්වයකින් උපමාලංකාර, රූපකාලංකාර වර්ණනාවට පාත්‍ර කරමින් බුද්ධ වන්දනයේ නියැලීමට අමතක නොකළේ ය. මෙලෙස මහා කාව්‍යයක් ලෙස ආරම්භ කළ ද එය සාර්ථක නොවේ. කතුවරයා මඛාදේව ජාතකයේ සඳහන් නොවන බොහෝ දේ මෙහි විස්තර කරමින් මෙය නිමාවට පත් කරයි. “පෙදෙන් බුදු සිරිත” යන නීතිය අනුව කාව්‍ය ගලා යාමට අවකාශය නොලැබී ය. ඒ අනුව මෙහි දී එය මහා කාව්‍ය ලක්ෂණ සමග සට්ටනයක් ඇති වේ. එබැවින් මෙය සාර්ථක කාව්‍යයක් නොවනු ඇත.

## 3. අනුචිත වර්ණනා කිරීම

සාර්ථක මහා කාව්‍ය සඳහා අලංකාර වැනුම් යොදා ගැනීම ද මෙහි දී වැදගත් ය. එනමුදු **මුවදෙව්දාවතෙහි** මෙකී සියලු වැනුම් අන්තර්ගත නොවන අතර, තාපස පැවිදි මඛාදේව රජු තපස් රැකීමට ප්‍රවේශ වූ වනය පිළිබඳ වර්ණනා කරයි. එහි මහා කාව්‍යයන්හි විස්තර විය යුතු පුර වර්ණනාව, සගල් පුර වැනුම, සයුරු ගිරි වැනුම, සඳ උදාව, හිරු උදාව යන වැනුමෙන් ද දියකෙළි, හා සුරතකෙළි, පුර වැනුම්, සමුද්‍ර වර්ණනා, තඩාග වර්ණනාව, පර්වත වර්ණනයක්, චන්ද්‍රෝදය වර්ණනාවක් හා සූර්යෝදය වර්ණනාවක් ආදි වර්ණනා මෙහි අන්තර්ගත නොවේ.

මෙහි අන්තර්ගත වන්නේ,

1. නගර වර්ණනය
2. රාජ වර්ණනය
3. ඍතු වර්ණනයේ සරත් ඍතු වර්ණනය
4. උයන් වර්ණනය
5. සන්ධ්‍යා වර්ණනය
6. නිශා වර්ණනය
7. උදා වර්ණනය

කවියා ආරම්භක කාව්‍යවලින් එනම්, අටවන කවියේ සිට මියුලු නුවර වර්ණනාව නගර වර්ණනාවක් ලෙස වර්ණනාවට ලක් කළේ ය.

"අනේ නුවර දෙලෙ
නුඳුළ දඹදිව් තල විමල්
රන් පියුමැත් කෙමි එව්
බිජී නුවර මියුලු නම්" (ගමලත්, 1998, පි. 189).

"නොයෙක් වූ නගර නමැති පෙතිවලින් බැබළෙන්නා වූ ජම්බුද්වීපය නමැති නිර්මල වූ රන් නෙළුමෙහි මහා කෙමිය මෙන් මියුලු නුවර විරාජමාන ව පවතින්නේ ය" (ගමලත්, 1998, පි. 189). යනු මෙහි අදහස යි. මෙලෙස ආරම්භ වන නගර වර්ණනය ගී විසි පහක් සමග ගලා යන්නේ තපස් රැකීමට ගිය වනය මුල් කොට ගනිමිනි. මියුලු නගරයේ දක්නට ලැබෙන්නා වූ ප්‍රාසාද, තොරණ, ප්‍රාකාර ආදිය ද මියුලු නුවර වෙසෙන සොඳුරු කාන්තාවන් ද ඇතුන් ද කවිසමයානුරූපී ව වර්ණනාවට ලක් කළ ද මෙම මියුලු නුවර වර්ණනාවෙන් කවියා දීර්ඝ වර්ණනාවට ලක් කර ඇත්තේ ලෞකික ජීවිතය හා බැඳුණු ස්වභාවික පරිසරය ඇති වස්තූන් හා පුද්ගලයන්ට ය. ඒ සඳහා රජු කිසිඳු සම්බන්ධතාවක් නොදක්වන බවත් පැහැදිලි වේ. මෙකී හේතු පදනම් කර ගනිමින් **මුවදෙව්දාවත** සැබැවින් ම අසාර්ථක කාව්‍යයක් බව කියවේ.

ආනන්ද කුලසූරිය මහතාගේ අදහසට අනුව මෙහි පුර වැනුම්, රජ වැනුම් ආදි නොවැදගත් වැනුම් රැසක් ම **මුවදෙව්දාවතෙහි** අන්තර්ගත කර ඇති බව පවසයි. **මුවදෙව්දාවතෙන්** ශාන්ත රසය ඉස්මතු කරලීමට කවියා උත්සාහ කර ඇති බවක් මෙයින් පැහැදිලි වේ. පහත දක්වා ඇති වර්ණනාවෙන් ඒ බව තවදුරටත් පහැදිලි කර ගත හැකි ය.

සන්ධ්‍යා වර්ණනාව, උදා වර්ණනාව සහ ඍතු වර්ණනාව ද මේ සමග ම වර්ණනා කරයි.

"මනදොළ හළු සලළු
සුර කැන් මදොව් කෙළියේ
නුවන් රසයින් සසිරි
සිරි පැමිණී ඒ පුර පිරි" (ගමලත්, 1998, පි. 190).

කවියා මෙසේ දීර්ඝ වශයෙන් වර්ණනා කරන්නේ ලෞකික ජීවිතය හා බැඳුණු වස්තූන් හා පුද්ගලයන් ය. මෙසේ වර්ණනාවට ලක් කරන කිසිඳු දෙයක් සමග මඛාදේව රජු කායික ව හෝ මානසික ව සම්බන්ධයක් පැවැත්වීම පිළිබඳ ව කාව්‍යයෙන් හෙළි නොවේ. කම් සුව විඳීම ප්‍රතික්ෂේප කර තපස් රකින්නට යන්න සූදානම් වී සිටින කෙනෙකු මෙවැනි අනුරාගී පරිසරයක විසීම සැබැවින් ම උචිත වූවක් නම් නොවේ. මෙකී අනුචිත වැනුම්වලින් ජනිත වන්නා වූ ශෘංගාර රස මිශ්‍ර විෂයාසක්තභාවය කාව්‍යයේ මුඛ්‍ය රසය වන ශාන්ත හෝ නිර්වේද රසයට ප්‍රතිවිරෝධී බවක් පෙන්වයි. මියුලු නුවර වර්ණනයෙන් පසු ව කවියා එළඹෙන්නේ රාජ වර්ණනාව සඳහා යි. මියුලු නුවර වර්ණනාවෙන් කවියා දීර්ඝ වර්ණනාවට ලක් කර ඇත්තේ ලෞකික ජීවිතය හා බැඳුණු ස්වාභාවික පරිසරයේ ඇති වස්තූන් හා පුද්ගලයන් ය. ඒ සඳහා රජු කිසිඳු සම්බන්ධතාවක් නොදක්වන බවත් පැහැදිලි වේ. මෙකී හේතු පදනම් කර ගනිමින් **මුවදෙව්දාවත** සැබැවින් ම අසාර්ථක කාව්‍යයක් බව පැහැදිලි වේ.

"උව්දු උරෙහි තමා
පිළිබිඹු දිසුත් නුසුහු
සතුටුව එ නරවරා
වුසූ සිරි පා මුල් හි" (ගමලත්, 1998, පි. 191).

ශ්‍රී කාන්තා තොමෝ විශ්ණු දිව්‍ය රාජයාගේ උරතලයෙහි තමාගේ පිළිබිඹුව දැක, ඉන් නොසතුටු ව ඒ මඛාදේව රජතුමාගේ පාමුල සතුටින් වාසය කළා ය. (ගමලත්, 1998, පි. 191). රජු යුද්ධවලට සහභාගී වීම වෙනුවට තපසට යන බවක් දක්වයි. ඔහු මුළු ලොවට දන් දෙමින් තපසෙහි යෙදෙයි.

"ඔබා සත තැවුලිය
මුළු ලොව්හි දන් දෙමිනිදු
දොර ද නො දිනෙ නරනිදු
නරතුරු දුගී ගරහට" (ගමලත්, 1998, පි. 192).

සකලවිධ ලෝකයේ සන්තාපය නසා නිරන්තරයෙන් දන් දෙමින් දුප්පත්කම නම් වූ ගෘහයට ඇතුළු වීමට ඉඩ නොදුන්නේ ය. (ගමලත්, 1998, පි. 192). මේ රජු තුළ ඇතැයි පවසන තේජස වීර්ය ආදි ගුණාංග මත රසය පෝෂණය නොකරයි. කම් සැප විඳීම ප්‍රතික්ෂේප කරන තත්ත්වයෙන් තපසට යන මඛාදේව රජුට යුද වර්ණනා, වීරත්වය ආදි ගුණ වර්ණනා කිරීමට නොහැකි වේ. මෙම **මුවදෙව්දාවත** වැනුමේ වර්ණනාව මඛාදේව ජාතකය අනුව නොයන බව පැහැදිලි කරගත හැකි ය.

මෙහි දක්නට ඇති එක ම ඍතු වර්ණනය නම් සරත් ඍතුව යි. මෙය කාව්‍යයන්ට ඉතා අපහසුවෙන් ඇතුළත් කර වූ බවක් නම් පෙනේ. මෙහි දී දක්නට ලැබෙන විශේෂතාව වන්නේ මෙම වර්ණනාව මෙහි මුඛ්‍ය චරිතය සමග කිසිදු සම්බන්ධතාවකින් තොර ව වර්ණනා කිරීම යි. සරත් ඍතුවේ සෞන්දර්යය ඒ චරිතය විසින් ආස්වාදනය කරනු ලැබිය යුතු වුව ද **මුවදෙව්දාවතෙහි** එසේ සිදු නොවේ. ප්‍රධාන චරිතය වටා ගෙතෙන අලංකාර උපමා, රූපක ආදිය යොදා ගනිමින් අලංකාර කිරීම වෙනුවට තාපස පැවිද්දෙන් දිවි ගෙවන මඛාදේව රජුගේ අවට පරිසරයේ සුන්දරත්වය කාව්‍යයට අනුචිත අයුරින් විස්තර කරයි. කතුවරයා මෙහි දී පවසන්නේ මඛාදේව රජු බෞද්ධයකු බවත්, එකී මඛාදේව රජතුමා රජ කරන කල්හි ඔවුන්ට සරත් කාලය පැමිණෙන්නේ ය යනුවෙනි. එනම් බෞද්ධ රජෙකු රාජ්‍යත්වයට පත්වීමෙන් හා රජෙකු බෞද්ධයකු ලෙස හැසිරීමෙන් රටට උදා වන්නේ සරත් කාලය බව ඒත්තු ගන්වයි.

ඒ අනුව ඍතු වර්ණනයෙහි ප්‍රධාන චරිතය වූ මඛාදේව රජු හා යොදා ගත් සරත් වර්ණනය දෙපස විස්තර කරයි.

"කෙරෙමින් මෙන් නිතින්
වන වමියන් මන් පෙරටු
හමළ කොමළ මඳ මඳ
මුවරද ගඳවල පවන්" (ගමලත්, 1998, පි. 193).

කෝමල වුව ද මකරන්ද ස්වාධීන ආකුල වූ ද මන්ද මාරුතය ගිරගින්ගේ සිත් උනන්දු කරවමින් මෙන් සෙමින් සෙමින් හැමී ය. (ගමලත්, 1998, පි. 193). සරත් ඍතුව එහි පරිසරය අලංකාර ගත් වන අයුරු එකී

9 772950 655005

සෘතුවෙහි එනම්, මන්ද මාරුතය තිරයන්ගෙන් දෙන්නව වීර හිමියන්ගේ ගුරුහිමියන්ගේ සිතට කාවදින අයුරින් ඔවුන් උනන්දු කරවමින් මෙන් සෙමින් සෙමින් හමන බව කවියා පවසයි.

මෙලෙස ආලංකාරිකයන් විසින් දක්වන ලද වර්ණනා **මුවදෙව්දාවතෙහි** ඇතුළත් නොවීමෙන් හා අනුචිත වර්ණනා අන්තර්ගත කිරීමෙන් මෙම කාව්‍ය අසාර්ථක කාව්‍යයක් බව මෙයින් පිළිබිඹු කර ගත හැකි ය. සරත් වර්ණනයක් මෙන් ම සන්ධ්‍යා කාල වර්ණනයක් ද මෙහි අන්තර්ගත කොට තිබේ. එහෙත් ඇතැම් වැනුම් කාව්‍යයේ ප්‍රධාන චරිතය වන මඛාදේව රජුගේ කිසිදු සහභාගිත්වයකින් තොර ව ගෙවන ලද්දකි. සන්ධ්‍යා වර්ණනයෙන් අනතුරු ව නිශා වර්ණනය ද උදා වේ.

**නිශා වර්ණනය**

"කලුන් කන් මහනෙල්
ගිල් ලැබ වැට මැඩිය ද
මනදොළ පිරි පියන්
රසන් දම් මිණි මෙරජ රජ" (ගමලත්, 1998, පි. 196).

රජ නිළියන්ගේ කනෙහි පැලඳි ඇත්තේ නිල් මානෙල් මල්වලින් පහර ලැබ පහන් නිවී ගිය ද රසනා දාමයෙහි මැණික්වල කාන්තිය වල්ලභයන්ගේ මනදොළ පිරී ය. (ගමලත්, 1998, පි. 196).

කාන්තාවන්ගේ කනේ පැලඳි ඇති නිල් මහනෙල් මල් නිසා වල්ලභයන්ගේ මනදොළ පිරී ඉතිරී යයි. මෙලෙස නගර වැසියන්ට අතිශය අපූර්වත්වයකින් යුක්ත ව රාත්‍රිය ගෙවීමට සැලැස්වුව ද ප්‍රධාන නායකයා වන මඛාදේව රජුගේ චරිතය සමග ඒ කිසිදු සම්බන්ධයක් නො වී ය. ඒ මන්ද යත් ඔහු තාපසයකු ලෙස වනයේ වාසය කරන නිසාවෙන් විය යුතු ය. මෙකී රැය අතිශයින් ම අඹුසැමි යුවළට සතුට සොම්නස පිරුණු රාත්‍රියක් උදාකරයි. මෙකී කාර්යයන් ශෘංගාර රසය හා මුඛ්‍ය ශාන්ත රසයට අනුචිත අයුරින් යොදාගෙන ඇති අතර, එහෙයින් කාව්‍යයට කිසිදු හානියක් නොවන ලෙස ඉවත් කර ගැනීමට හැකියාව ලැබී ඇත.

**මුවදෙව්දාවත** කතුවරයා මෙම ජාතක කථාව සඳහා වස්තු විෂය කර ගැනීමට වෙනත් හේතු පවතින්නට ඇතැයි ඇතැම් විද්වතුන්ගේ අදහස විය. මෙහි ඇතැම් වර්ණනා කතා පුවත හා ඓන්ද්‍රිය ලෙස සම්බන්ධතාවක් නොදක්වයි. මේවා කවියාගේ අභිමතය පරිදි වෙනස් කරමින් උචිත අයුරින් වර්ණනා කර ඇති බවක් පෙනේ. මඛාදේව ජාතක කතාවේ විස්තර නොවන සිදුවීම් මෙහි විස්තරාත්මක ව දක්වා තිබේ.

ආනන්ද කුලසූරිය පවසන පරිදි, පුර වැනුම්, රජ වැනුම් ආදි නොවැදගත් වැනුම් රැසක් ම **මුවදෙව්දාවතේ** අන්තර්ගත කර ඇත. **මුවදෙව්දාවතෙන්** ශාන්ත රසය ඉස්මතු කරලීමට කවියා උත්සාහ කර ඇති බවක් මෙයින් පැහැදිලි වේ.

9 772950 655005

**උදා වැනුම**

මින් පසු ව උදාවන්නේ උදා වැනුම යි. මේ සඳහා කවියා ප්‍රධාන නායකයා වූ මඛාදේව රජු මේ හා සම්බන්ධ කිරීමට සමත් වී ඇත. රජුගේ සිරියහන් ගබඩාව අසල සිට හිරු උදාවේ සුන්දරත්වය ගායනා කරන විලාසයෙන් මෙකී වැනුම වර්ණනාවට පාත්‍ර කර තිබෙනු පෙනේ.

> "මරා මිණි තැටියොත
> කොමළ මුතු සිරි බිජී
> නෙලුඹු දළ ගබ සසිනිඳු
> පැහැසර රැඳි තුෂර බිඳු" (ගම්ලත්, 1998, පි. 196).

සිනිඳු හෝ නෙලුම් කොළ ඇතුළෙහි බබලන්නා වූ හිම බිංදු මරකත මැණික් තැටියක ලූ කෝමල වූ මුතු රැසක ස්වභාවයක් දැක්වී ය. උදා සිරි වැනුම ඇසූ රජ තෙමේ විගසින් ම මතු මහලට නැඟී එහි දී කපුවා රජුගේ හිසෙහි නර කෙසක් දැක ඒ බව රජුට විස්තර කරන අතර ව්‍යාජ වූ වර්ණනාවක් ලෙස දක්වයි. කිසිඳු චමත්කාරජනක අලංකාරයක් නොනිපදවයි. එයින් උපදින ගිහි කල හැඟීම් තාපසයකු වෙනුවෙන් වර්ණනා කිරීම මහා කාව්‍ය සම්ප්‍රදායට ගැති නොවේ.

මහා කාව්‍යයක අන්තර්ගත විය යුතු ජීව ගුණය වන ලෞකික ජීවිතේ ආස්වාදනීයභාවය මෙහි ඉස්මතු නොවේ. සාමාන්‍යයෙන් මහා කාව්‍යයක විස්තර වන අයුරින් රජු උයනට පිවිසෙන්නේ තම අන්තඃපුර කාන්තාවන් සමග උයන් කෙළි පිණිස ය. එහෙත් මඛාදේව රජු  උයන වෙත ඇදෙන්නේ තනි ව හා විනෝදය පිණිස නො ව, තම ගත සිත ආදිය තැන්පත් කර ගනිමින් තපස් රැකීම උදෙසා ය.

**මඟුල් උයන් වැනුම**

සංස්කෘත මහා කාව්‍ය රචනා කළ කවීහු රජුගේ කාම රාග ජීවිතය මඟුල් උයනේ සුන්දරත්වය සමග ගළපා නොයෙක් කාව්‍යෝක්තීන් මගින් වර්ණනාවට ලක් කරති. එහෙත් **මුවදෙව්දාවත** කතුවරයා එය ඉදිරිපත් කරනුයේ මඛාදේව රජුගේ භාවනායෝගී ජීවිත අනුකූල වර්ණනාත්මක රීතියකිනි.

> "නිහිය තනවා ලලා
> බිඟුවල සුපුල් සල්
> හමළ සුළඟ මඳ මඳ
> රිසිනු එනරවරා" (ගම්ලත්, 1998, පි. 199).

මාරුතේ තෙමේ භෝගයන්ගේ ආකුල ව පිපුණු ශාල වෘක්ෂයන් සෙමෙන් කම්පිත කරමින් ඒ රජුගේ අභිප්‍රායට අනුකූල ව ඉතා මඳ මඳ හැමී ය. (ගම්ලත්, 1998, පි. 199). කවියා මඟුල් උයන නිහඬ කොට එහි ස්වභාවය සෞන්දර්ය ආස්වාදනීය බව මඛාදේව තවුසාගේ වීතරාගී ජීවිතයේ දිගහැරීමට ඉඩ හරී. නිදහසේ මුඛ්‍යාර්ථය සමග ගැළපුණත් මහා කාව්‍ය සම්ප්‍රදායේ අරමුණු මුදුන්පත් කිරීමට නම්

සමත් නොවෙයි. ජාතක කථාවේ සඳහන් වන්නේ මඛාදේව රජු මඟුල් උයනේ ම භාවනා කොට මෙලොවින් බැහැර ව බඹ ලොව උපන් බව යි.

එහෙත් කවියා මෙහි දී දහමට ඇතුළු කිරීමේ අදහසින් මඛාදේව තවුසා මඟුල් උයනින් හිමාලය වනයට පිටත් කර හරියි. කූජන දැනුම මෙන් ම මේ වන දැනුමත් මඛාදේව තවුසාගේ නිකෙලෙස් ජීවිතයට ආරෝපණය කිරීමට කවියා තැත් දරා ඇති බව පැහැදිලි වෙයි. ඇතැම් වර්ණනා අන්තර්ගත කරමින් **මුවදෙව්දාවත** අලංකාරවත් අයුරින් රචනා කර ඇති අතර, මෙහි දී යම් තරමක මහා කාව්‍ය ලක්ෂණ ඉස්මතු කර වූ බව පැහැදිලි වේ. මහා කාව්‍යයක අන්තර්ගත විය යුතු සෑම වර්ණනාවක් ම ගැබ් නොවූ ව ද තරමක් අන්තර්ගත කරයි.

## ප්‍රතිභාපූර්ණ කවීත්වයෙන් තොර වීම

කනට මිහිරක් ගෙනෙන වර්ණනා රසිකයා තෘප්තිමත් කිරීමට සමත් වන්නේ නම්, ඇතුළත් කරුණුවල විස්තීරණ බව හෝ සංක්ෂිප්ත බව නොවැදගත් වන බවක් ද ප්‍රසිද්ධ කරුණකි.

මුවදෙව්දාවත උපමා, රූපක අර්ථාන්තරන්‍යාස ආදි අලංකාරවලින් සරසා ඇත. නොයෙක් ස්ථානයන්හි යමක අනුප්‍රාස ආදි ශබ්දාලංකාර ද අන්තර්ගත වී ඇත. ඇතැම් විට අලංකාරයෙන් හා රස භාවයන්ගෙන් යුක්ත ව රචනා කිරීමට ද වගබලා ගෙන ඇති බව පැහැදිලි ය. අලංකාරය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. එනම්,

i. ශබ්දාලංකාර
ii. අර්ථාලංකාර

යන්න යි. මහා කාව්‍යයක් සඳහා මෙකී අලංකාර වැදගත් බව අවධාරණය කරයි.

“කොමළ මද නල පත්
පුල් වන පෙත් හිමියා
නැමී නැමී මල් බර
ගන සා හිසින් වැදි එව්” (ගමලත්, 1998, පි. 196).

**මුවාදෙව්දාවතේ** කවියා අනුප්‍රාසවත් පද සංඝටනාවක් මගින් ශබ්ද මාධූර්යය ඇති කරමින් රසෝද්දීපනය සිදු කරයි. **මුවාදෙව්දාවතේ** බොහෝ කවි අනුප්‍රාසයකින් යුතු ව වර්ණනා කරයි. යමක නම්, පද්‍යාපාදයන්හි දුරුකොට එක හා සමාන වූ අක්ෂර හෝ පද නැවත යෙදීම මෙහි දී සිදු කෙරේ.

මඛාදේව රජු වන ගත වීමෙන් පසු ව ඍතු වර්ණනය එයි. සරත් ඍතුවෙන් පරිසරයේ සිදු වූ ස්වභාව සෞන්දර්යය කවියා විස්තර කරනුයේ,

“සමග ගිය ඇවිළී
විළී බලා වැළ සරා
සරා නුබ කුස්හි දුනු

දුනු තිසර වැළ සිරිත්" (ගම්ලත්, 1998, පි. 193).

සරත් අඹරෝරෙහි පෙනෙන්නට වූ හංස සමූහයාගේ ශෝභාවෙන් පරදවනු ලැබූ කොක් පෙළ ලජ්ජාවෙන් එක්වර හැකිලී ගියාක් මෙන් විය. කතුවරයා සරත් ඍතුවෙහි පරිසරයේ සිදු වූ අපූරු සිදුවීමක් රමණීය අයුරින් වර්ණනා කරයි. මෙලෙස **මුවදෙව්දාවතෙහි** අලංකාර රසක් උපයෝගී කොට ගනිමින් කාව්‍ය රචනා කර ඇත.

රූපකාලංකාර යෙදීම ද බහුල ව දැකගත හැකි ය. සරත් ඍතුවෙන් වනයේ සිදු වන වෙනස්කම් රූපක යොදා ගනිමින් එක් එක් වස්තූන්ට උපමා කර දක්වයි. ඉතා උචිත අයුරින් පද සංඝටනය කරමින් මෙය අලංකාරවත් කර ඇති අතර, කවියා ඒ පිළිබඳ ව නම් අවධානයක් යොමු කර ඇති බව පෙනෙයි.

"උපුල් නෙතින් තඹුරු
කැකුළු පින් පියොවුරින්
තිසර වැළ ලෙළ මෙවුලින්
මන ගත්හු විල් යොනෝ" (ගම්ලත්, 1998, පි. 194).

"විල් නමැති යුවතීහු මහනෙල් නමැති නේත්‍රයෙන් ද පියුම් කැකුළු නමැති පුන් පියයුරින් ද හංස පන්ති නමැති මේඛලා දාමයන්ගෙන් ද දුටුවන් සිත් ගත්තෝ ය." (ගම්ලත්, 1998, පි. 194). පරිසරයේ ඇති එක් එක් වස්තූන් රූපකාර්ථවත් කරයි. විල යුවතීන්ට රූපකාර්ථවත් කරයි. විලෙහි ඇති මානෙල් මල් එම යුවතීන්ගේ දෙනෙත වන අතර, එහි ඇති පියුම් කැකුළු යුවතීන්ගේ පිරිපුන් පයෝධර බව පවසයි. විලෙහි සිටින හංසයන් ඇයගේ මේඛලා දාමය බව පවසයි. මෙලෙස කවියා බොහෝ තැන්හි උපමාලංකාරයට වඩා රූපකාලංකාරය කෙරෙහි අවධානයක් යොමු කරයි.

කාව්‍ය විචිත්‍රවත් බව මෙහි දී වඩා වැදගත් වන අතර, එපමණක් ම නො ව ප්‍රබල වශයෙන් ම රසිකයා තෘප්තිමත් කිරීම මෙහි දී වැදගත් ය. **මුවදෙව්දාවතෙහි** එන ඇතැම් වර්ණනාවලින් රසභාවයට හානියක් නොවී ඇති අතර, උයන් වැනුමෙන් රාගය ප්‍රතීත නොකරයි. අලංකාරිකයෝ එලෙස දැක්වුව ද **මුවදෙව්දාවත** කතුවරයා රසිකයා තෘප්තිය පත් කළ යුතු තැන්හි තෘප්තිමත් කිරීමට සමත් නොවේ. එහෙයින් මෙය මහා කාව්‍යයක් ලෙස අසාර්ථක බව කිව යුතු නොවේ.

### 4. තම අභිමතය පරිදි වර්ණනා එක් කිරීම

කවියාට තමාගේ අභිමතය පරිදි යම් අදහසක් හෝ අංගයක් වුවත් ඇතුළත් කළ හැකි ය. මෙය තවදුරටත් විස්තාරණය කරන්නේ නම්, මඛාදේව ජාතකයේ සඳහන් වන්නේ, මඛාදේව රජු මඟුල් උයනේ ම භාවනා කොට මෙලොවින් බැහැර ව බඹ ලොව උපන් බව යි. එහෙත් කවියා මෙහි දී දහමට ඇතුළු කිරීමේ අදහසින් මඛාදේව තවුසා මඟුල් උයනින් හිමාලය වනයට පිටත් කර හරියි. කුජන දැනුම මෙන් ම මේ වන දැනුමත් මඛාදේව තවුසාගේ නිකෙලෙස් ජීවිතයට ආරෝපණය කිරීමට කවියා තැත් දරා ඇති බව පැහැදිලි වෙයි. පැරණි කථා වස්තුවක් වුව ද කවියාගේ රුචිකත්වය පරිදි එය

වෙනස් කිරීමට ආලංකාරිකයන්ට ඉඩ ප්‍රස්තාව ලබා දී ඇත. මෙහි දී මෙම කාව්‍ය අසාර්ථක කාව්‍යක් ලෙස සැලකිය හැකි ය.

කාව්‍යමය ගුණයෙන් අනූන නිර්මාණයක් ලෙස **මුවදෙව්දාවත** සැලකුව ද ඇතැම් අලංකරණ **මුවදෙව්දාවතෙහි** අන්තර්ගත වී නොමැති බැවින් මෙය සාර්ථක කාව්‍යයක් ලෙස දැක්විය නොහැකි බව මින් ප්‍රත්‍යක්ෂ කර ගත හැකි ය.

## සමාලෝචනය

අලංකාරවාදය විසින් නිර්දිෂ්ට විශිෂ්ටතම කාව්‍ය සම්ප්‍රදාය නම් මහා කාව්‍යය යි. සියලු කාව්‍ය විශේෂ අතර මහා කාව්‍ය අග්‍රගණ්‍ය කර සලකන ලදි. **මුවදෙව්දාවත** කතුවරයා **සියබස්ලකරෙහි** උපදේශ අනුගමනය කරමින් බෝසත් සිරිතක් ම අනුගමනය කරමින් මහා කාව්‍ය රචනා කරන ලදි. ජාතකට්ඨ කථාවේ එන මඛාදේව ජාතකය ඇසුරින් රචනා කරන ලද මෙහි **සියබස්ලකරෙහි** එන බොහෝ මහා කාව්‍ය ලක්ෂණ උද්දීපනය නොකරයි. මඛාදේව ජාතකය මහා කාව්‍යයක් ලෙස සකසා ගැනීමේ දී කවියාගේ මූලික අභිප්‍රාය වූයේ බෝසත්කම සිරිතක් කීම වුව ද එය මහා කාව්‍යයක් ලෙස ඉදිරිපත් කිරීම යි. කෙසේ වෙතත් මෙහි දී **සියබස්ලකර** අනුව යමින් **මුවදෙව්දාවතේ** කවියා එය මහා කාව්‍ය ලක්ෂණ අන්තර්ගත නොකරමින් ‘‘පෙදෙන් බුදු සිරිත’’ නීතියෙන් හා මහා කාව්‍ය ලක්ෂණවලින් කාව්‍ය රසවත් කිරීමට ද අපූරු පද සංඝටනාවකින් යුක්ත ව ඉදිරිපත් කිරීමට සමත් වී ඇති බැව් පෙනෙයි. මේ අනුව සමස්තයක් ලෙස **මුවදෙව්දාවත**,

- වස්තු විෂය කරගත් ජාතක කථාවේ නුසුදුසු බව
- ‘‘පෙදෙන් බුදු සිරිත’’ යන නීතියත් මහා කාව්‍ය සම්ප්‍රදායත් අතර ඇති වන ගැටුම
- ප්‍රතිභාපූර්ණ බවින් තොර වීම
- අනුචිත වර්ණනා කිරීම
- තම අභිමතය පරිදි වර්ණනා එක් කිරීම

ආදි ලක්ෂණ අනුව කාව්‍ය ලක්ෂණ ඉස්මතු නොකරන හෙයින් අසාර්ථක කාව්‍යයක් බව ප්‍රතීයමාන කර ගත හැකි වේ.

9 772950 655005

## ආශ්‍රිත මූලාශ්‍රය නාමාවලිය

ගම්ලත්, සුචරිත. (1998). **සම්භාව්‍ය සිංහල කාව්‍යයේ විකාසය.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ගම්ලත්, සුචරිත. (2018). **කව්සිළුමිණ විනිස.** නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

තිලකසිරි, සිරි. (2001). **කව්සිළුමිණ.** කොළඹ: රත්න ප්‍රකාශකයෝ.

වනරත්න, රංජිත්. (2002). **මුවදෙව් දා වත.** කොළඹ: සමයවර්ධන පොත්හල.

සෝරත, වැලිවිටියේ. (1949). **කල්පලතා ව්‍යාඛ්‍යා සහිත කව්සිළුමිණ.** කොළඹ: විද. පිරිවෙණ ආදි ශිෂ්‍ය සංගමය.

අමුණුගම වලව්වේ වත්සලා ලක්මාලි කුමාරි ගුණතිලක
සිව්වන වසර
සිංහල අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය
Wathsalaamunugama95@gmail.com

9 772950 655005